# නගරාශ්‍රිත සෞඛ්‍ය සහ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (SHIFT)

# ඇබෑර්තු

## (ව්‍යාපෘති කොන්ත්‍රාත් පදනම මත)

නගරාශ්‍රිත සෞඛ්‍ය සහ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ (SHIFT) පවත්නා පහත සඳහන් ඇබෑර්තුව සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් මෙමගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

### ජ්‍යෙෂ්ඨ සමාජ නිලධාරී තනතුර (තනතුරු 01)

**වැටුප් කේතය** : PS5 (රු. 95,000.00 + ජීවන වියදම් දීමනාව)

**ව්‍යාපෘති ප්‍රභේදය** : ඇමරිකානු ඩොලර් මිලියන 100 ට ඉහළ හා ඇමරිකානු ඩොලර් මිලියන 250 අඩු

**සුදුසුකම් හා පළපුරුද්ද :**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධිය

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා සුදුසුකමක්

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තිමය ආයතනයක් මගින් ලබාගන්නා ලද ආශ්‍රිත සාමාජිකත්වය වෘත්තිමය සුදුසුකම්

**සහ**

අවම වශයෙන් ජල සහ සනීපාරක්ෂක ව්‍යාපෘතීන්හි වසර 05 ක පළපුරුද්ද.

යටිතල පහසුකම් ව්‍යාපෘතීන්හි ප්‍රජා සවලීකරණ ක්‍රියාකාරකම් සහ ESHS ක්‍රියාකාරකම් පිළිබඳ පළපුරුද්ද ඇති අයට ප්‍රමුඛත්වය දෙනු ලැබේ.

**සාමාන්‍ය කොන්දේසි :**

**වයස් සීමාව :**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 65 ට අඩු විය යුතුය.

**සේවාවේ කොන්දේසි හා නියමයන් :**

පත්වීම් ආරම්භක වශයෙන් වසරක කාල පරිච්ඡේදයක් සඳහා වන අතර, සතුටුදායක කාර්ය සාධන ඇගයීම් මත වාර්ෂිකව අලුත්කිරීමට යටත් වේ. පරිපාලන චක්‍රලේඛ අංක 01/2019 සඳහන් කොන්දේසි මෙම පත්වීමට අදාළ වනු ඇත.

**තෝරාගන්නා ක්‍රමවේදය :**

සුදුසුකම් හා පළපුරුද්ද මත කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණයේ කාර්ය සාධනය මත පදනම්ව තෝරාගැනීම සිදු කරනු ලැබේ.

සම්පූර්ණ ජීව දත්ත, අධ්‍යාපනික සහ වෘත්තිමය සුදුසුකම්, පෙර පළපුරුද්ද සඳහා වන සහතිකයන්හි පිටපත් සමග ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට 2022.05.18 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය. ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්කරන ලද තනතුර ලියුම් කවරයෙහි වම්පස උඩු කෙළවරෙහි සඳහන් කළ යුතුය. රාජ්‍ය / සංස්ථා සංවිධානයන්හි අයදුම්කරුවන්ගේ අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානියාගේ මාර්ගයෙන් ලැබීමට සැලැස්විය යුතුය.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**නගරාශ්‍රිත සෞඛ්‍ය සහ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය,**
**නො. 38, චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව.**

**2022.04.25**